**කඩුගන්නාව නගර සභාව - 2021**
**-------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

කඩුගන්නාව නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
---------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ දැන්වීම් පුවරු ආදායම් හා හිඟහිටි, ඉදිරියට ලද දැන්වීම් පුවරු ආදායම් සම්බන්ධයෙන් ලෙජර ගිණුම් පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.315,500 ක දැන්වීම් පුවරු ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී දැන්වීම් පුවරු ආදායම් සම්බන්ධයෙන් හිඟහිටි හා ඉදිරියට ලද දැන්වීම් පුවරු ආදායම් ගිණුම් ලෙජරයේ පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වර්ෂයට අදාළ ආදායම හා හිඟය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | එකතුව රු.2,525,624 ක ස්ථාවර වත්කම් ශේෂ 07 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්ගත කරන බව දන්වා ඇත. | සභාව සතු වත්කම් හඳුනාගෙන ඒවා නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | කඩුගන්නාව නගර සභා සංවර්ධන වැඩසටහන යටතේ අරමුදල් මූලාශ්‍ර 03 ක් ප්‍රතිපාදන මත ප්‍රවර්තන වර්ෂයේදී වැඩ අවසන් කර තිබුණු රු.4,910,737 ක කර්මාන්ත 07 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සඳහන් කර ඇති කර්මාන්ත ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වර්ෂයේ නිමකළ ව්‍යාපෘති වලට අදාළව කළ වැඩ වාර්තා අනුව පිරිවැය හඳුනාගෙන එම වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඈ) | විවිධ අවස්ථාවල දී සභාවට හිමිව තිබුණු රු.5,022,000 ක ඉඩම් කට්ටි 05 ක් ඇතුළුව ඉඩම් කට්ටි 16 ක් හා ඒවායේ පිහිටි ගොඩනැගිලි තුනක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | දක්වා ඇති ලැයිස්තුව පරීක්ෂා කර බලා 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | සභාව සතු දේපල හඳුනාගෙන ඒවා තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.104,220 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,367,771 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| වසර 05 කට වරක් වරිපනම් බදු තක්සේරු කළ යුතු වුවද නගර සභා බල ප්‍රදේශයේ සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු 2012 වර්ෂයේදී සිදුකළ තක්සේරු අගය මත අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරී හිඟයක් පවතින බැවින් මේ සඳහා අවශ්‍ය පිළියම් තක්සේරු දෙපාර්තමේන්තුව මේ වර්ෂයේදී ඉටුකර දීමට අපේක්ෂා කර ඇත. | නව තක්සේරු වාර්තා ලබා ගත යුතුය. |
| (ආ) වෙනත් ආදායම් | | |
| ප්‍රතිචක්‍රීය ද්‍රව්‍ය සමාලෝචිත වර්ෂයේ රු.212,678 ක අලෙවි ආදායමින් සියයට 80 ක් සෞඛ්‍ය අංශයේ සේවකයින් අතර දිරි දීමනා වශයෙන් ගෙවීම සඳහාද ඉතිරි සියයට 20 ක ප්‍රමාණය සභා ආදායමට අයකර ගැනීමටද සභාව තීරණය කිරීමේ දී ඊට අදාළ වියදම් සැලකිල්ලට ගෙන නොතිබුණු අතර දිරි දීමනා ගෙවීම සම්බන්ධයෙන් ආණ්ඩුකාරවර අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | ප්‍රවර්ථන වර්ෂයේදී මෙවන විට විධිමත් සභා අනුමැතිය ලබාගෙන ගෙවීමට කටයුතු කර ඇත. | ආණ්ඩුකාරවර අනුමැතිය ලබාගෙන සහ සේවකයින්ට අමතර දීමනා ගෙවීම් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ණයගැති ශේෂය රු.12,645,152 ක් වූ අතර ඉන් වසර 01 සිට 3 ත් අතර කාල පරාසයකට අදාළව අය නොවී තිබුණු ශේෂය රු.1,889,989 ක් විය. | වසරකට වඩා අඩු කාල පරාසයකට අදාළව පවතින ශේෂයෙන් රු.3,908,359 ක් අයකර ඇති බවත්, අවුරුදු 03ක කාල පරාසයක හිඟව පවත්නා කඩ කුලී හා තානායම් ගාස්තු අයකර ගැනීමට ලිපි මඟින් දැනුවත් කර ඇති බවත්, කඩ කාමර 03 ක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි. | ලැබිය යුතු සියලු ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | සංචාරක ආකර්ෂණය ඇති කිරීමේ අරමුණින් සංචාරක පුරවරයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සතු වර්ග අඩි 8000 ක් පමණ වන පොහොර ගබඩාව බදු පදනමට ලබා ගැනීමේදී ඒ සඳහා රු.1,360,800 ක් ගෙවා තිබුණි. එමෙන්ම ඊට අදාළ බදු දේපල සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මේ සම්බන්ධයෙන් වූ සැළැසුම්, ඇස්තමේන්තු හා ගතවන කාලය සම්බන්ධයෙන් තොරතුරු ලබාදෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති බවත් අදාල තොරතුරු ලද පසු ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව දන්වා ඇත. | විධිමත් ගිවිසුම් මත දේපල බදු ගැනීමට කටයුතු කළ යුතු අතර එම දේපල අපේක්ෂිත අරමුණ සඳහා යෙදවිය යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් භාවිතයට ගත නොහැකි රු.8,719,050 ක මෝටර් වාහන 03 ක් 2021 නොවැම්බර් 29 වන දින සභා තීරණයක් මත වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණ ද ඒවා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිෂ්කාර්යව පැවතුණි. | 2022.01.30 වන දින පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත තක්සේරු කමිටුවක් පත්කර දෙන ඉල්ලීම් ලිපියක් යොමුකර ඇත. | වාහන භාවිතයට ගත නොහැකි නම් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉදිකර තිබුණු දර භාවිතා කර ක්‍රියාත්මක කරන ආදාහනාගාරය ඉවත්කර ඒ වෙනුවට පළාත් පාලන අමාත්‍යාංශය මඟින් වෙන්කර ඇති රු. මිලියන 10 ක ප්‍රතිපාදන මුදලක් යොදවා ගෑස්වලින් ක්‍රියාකරන ආදාහනාගාරයක් ඉදිකිරීමට මහා සභාව විසින් තීරණය කර තිබුණද, නව ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු අතර දර යොදා ක්‍රියාත්මක ආදාහනාගාරය ද අක්‍රීයව පැවතුණි. | දර භාවිතා කර ක්‍රියාත්මක කළ ආදාහනාගාරය අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බැවින් අක්‍රීය තත්ත්වයේ පවතින බවත් ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | ප්‍රදේශයේ අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ක්‍රියාත්මක වන ආදාහනාගාරය යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 12 ක පුරප්පාඩු 19 ක් ද තනතුරු 02 ක අතිරික්තව පැවති සේවක සංඛ්‍යාව 15 ක්ද විය. ආයතනයේ අත්‍යවශ්‍යයෙන්ම පැවතිය යුතු මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර හා පුස්තකලාධිපති තනතුර සඳහා බඳවා ගැනීම් කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි. | මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු හා පුස්තකාලාධිපති තනතුරුවල ඌනතාවයක් ඇති බැවින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

--------------------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

විගණන නිරීක්ෂණය

-------------------------

නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එක්රැස් කරනු ලබන ටොන් 01 ක පමණ දිරන කසළ වාර්ෂිකව රු.243,000 ක් ගෙවා කිරිමැටිය ප්‍රදේශයේ කසළ අංගනයට රැගෙන ගොස් තිබුණු අතර, නොදිරන කසළ බේල් කර සමාලෝචිත වර්ෂයේ දී රු.182,754 ක වියදමක් දරා පුත්තලම ප්‍රදේශයට රැගෙන ගොස් තිබුණි. නගර සභාවේ කසළ බැහැර කිරීමට නිසි ස්ථානයක් හඳුනාගෙන විධිමත් පරිදි කසළ බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි.

සභාවේ අදහස් දැක්වීම

-------------------------

කසළ බැහැර කිරීම සඳහා නිශ්චිත ඉඩමක් සභාව සතුව නොවන බව හා ඉඩමක් හඳුනාගැනීමට කටයුතු කරන බව දන්වා ඇත.

නිර්දේශය

------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් පරිදි සිදු කිරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය.